**හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම**

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30 (1) වගන්තිය ප්‍රකාර ව 2024.07.26 දිනට හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදුනු බවට වසර 05කට නොඅඩු කාලයක් සහතික කළ හැකි ශ්‍රී ලාංකිකයන්ගෙන් ලියාපදිංචි විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය සමඟ වන ආකෘතියට අනුව අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලි කැපිටල් අකුරුවලින් පුරවා පහත දැක්වෙන ලේඛන හා අයදුම්පත් පරීක්ෂා කිරීමේ ගාස්තුව වන රු. 3,000.00 ක මුදල ලංකා බැංකුවේ හෝමියෝපති අරමුදලේ 0002026466 යන ගිණුම් අංකයට බැර කර එහි මුල් පිටපත ද අමුණා වෛද්‍ය සභාව වෙත යොමු කළ යුතුය.

1. ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ;
2. හෝමියෝපති ඖෂධ මිල දී ගැනීමේ බිල්පත් සහ රිසිට්පත් ;
3. හෝමියෝපති ලිපිගොනු වාර්තා ;
4. අදාළ පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකය ;
5. ස්වකීය සායන පරිශ්‍ර සඳහා අදාළ පළාත් පාලන ආයතන විසින් නිකුත් කරනු ලබන ගෙවීම් රිසිට්පත්‌

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2024 සැප්තැම්බර් මස 13 වැනි දින** වන අතර එදිනට පෙර ''ලේඛකාධිකාරී, අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ හෝ වෛද්‍ය සභාව වෙත අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය.

ලේඛකාධිකාරී (වැ. බ.)

අංක 94,
ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම